WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**44 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

නැටුම් (දේශීය) I, II
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

## නැටුම් (දේශීය) II

* **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **12** බැගින් හිමි වේ.

**1.** **සියලු ම** ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ **අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.**

(i) අයිලය යනු උඩරට නර්තන සම්ප්‍රදායට අයත් .............................................. ශාන්තිකර්මයේ ප්‍රධාන සැරසිල්ලකි.

(ii) කෝලම් නාටකයේ ප්‍රධාන ලක්ෂණයක් වනුයේ එක් එක් චරිත සඳහා .............................. පැළඳීමයි.

(iii) ආහාර්ය අභිනයේ ප්‍රධාන කොටස් දෙක වනුයේ අංග රචනය සහ ............................ රචනයයි.

(iv) කථකලි නර්තනයේ වාද්‍ය භාණ්ඩයක් වන .................................. උඩැක්කියේ හැඩයට සමාන වේ.

(v) මනිපුරි නර්තනයේ 'චූරි' නම් වූ මකුට පළඳනාව ............................ දෙවියන්ට වෙන්වූ විශේෂ ආභරණයකි.

(vi) විජය කුවේණි පුවතට අනුව ...................................... පුරයේ තූර්ය වාදන සහිත ගීත රාවයක් ඇසුණු බව මහාවංශයේ දැක්වේ.

(vii) භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව ලෝක ධර්මී හා .......................... යනුවෙන් නාට්‍ය ශෛලීන් දෙකක් නම් කර ඇත.

(viii) නර්තනය, අනිවාර්ය විෂයක් ලෙස පාසල් විෂයමාලාවට ඇතුළත් කරන ලද්දේ ............ වර්ෂයේදී ය.

(ix) හොරණ ශ්‍රීපාලි ආයතනයට මුල්ගල තැබුවේ කිනම් වර්ෂයක කවුරුන් විසින් ද?
(අ) වර්ෂය - ........................................
(ආ) කවුරුන් ද - ........................................

(x) ආගමික සිද්ධස්ථානයන්හි හේවිසි වාදනය සඳහා හොරණෑව සමග යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ **දෙක** නම් කරන්න.
(අ) ........................................
(ආ) ........................................

**2.** (i) මැදුම් මහ දෙතිතට (3 + 4) උඩරට හෝ පහතරට හෝ සබරගමු සම්ප්‍රදායට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

(ii) 'චන්ද නම් යස තේජ කුංකුම' ......... ප්‍රශස්ති කවිය මාත්‍රා තුනේ (3 + 3) තනි තිතට ප්‍රස්තාර කරන්න.

(iii) මුසලඩි වන්නමේ අඩව්ව හෝ ශුද්ධ තාලයේ ඉරට්ටිය හෝ කොවුලා වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න.

**3.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(i) සින්දු වන්නම්
(ii) වාචික අභිනය
(iii) ඔන්චිලි වාරම්
(iv) සතර බීජාක්ෂර
(v) අණ බෙර

[අටවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**4.** ශාන්තිකර්ම වූ කලී දේශීය නර්තන කලාවේ අනන්‍ය ලක්ෂණ පිළිබිඹු කරන සාධකයකි.

(i) පහතරට දෙවොල් මඩුවේ සිදු කෙරෙන චාරිත්‍ර විධි **දෙකක්** හඳුන්වන්න.

(ii) සබරගමු පහන් මඩුවේ භාවිත රංග වස්ත්‍රාභරණ පිළිබඳ විමසීමක් කරන්න.


(iii) කොහොඹා කංකාරි පුරාවෘත්ත කතාව මගින් සමාජයට ලබාදෙන උපදේශය පිළිබඳ විග්‍රහයක් කරන්න.

**5.** (i) කෝලම් **හෝ** සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු **දෙකක්** ලියා රඟමඬල පිළිබඳ විස්තරයක් කරන්න.

(ii) ගැමි සංස්කෘතියෙහි සමාජ සාරධර්ම හා විශ්වාස ගොඩනැගී ඇති ආකාරය ජන ගී උදාහරණයට ගෙන පෙන්වා දෙන්න.

(iii) නර්තන කලාවේ පෝෂණය සඳහා රචනා වූ පර්යේෂණාත්මක කෘතියක් නම් කර, ඒ පිළිබඳ විග්‍රහයක් කරන්න.

**6.** පහත දැක්වෙන රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) Ⓐ සහ Ⓑ රූපවල ඇති දේශීය මුද්‍රා නාට්‍ය **දෙක** නම් කර, ඉන් එක් මුද්‍රානාට්‍යයක් පිළිබඳ හැඳින්වීමක් කරන්න.

WWW.OLEVELAPI.COM

(ii) භාරතීය නර්තන සම්ප්‍රදායන් දැක්වෙන රූපවල රංගවස්ත්‍රාභරණ වෙන් කොට ලියා දක්වන්න.

(iii) Ⓔ රූපයේ දැක්වෙන රූපවාහිනී නර්තනය ඇසුරෙන් වේදිකාවක භාවිත තාක්ෂණික ශිල්පක්‍රම පිළිබඳ විග්‍රහයක් කරන්න.

**7.** (i) "නර්තන කලාව හැදෑරීමෙන් සහජීවනය සහ නායකත්ව ගුණාංග වර්ධනය වේ." මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

(ii) "අන්තර්ජාතික සම්බන්ධතා මත දේශීය නර්තන කලාවේ ප්‍රගමනයට පිටිවහලක් ලැබුණි." විමසුමට ලක් කරන්න.

(iii) "විවිධ නර්තන නිර්මාණයන් බිහිවීමත් සමග ප්‍රේක්ෂක ප්‍රතිචාර හා ආකර්ෂණය වර්ධනය විය." පහත සඳහන් සිරස්තල යටතේ විමසන්න.

- වේදිකා ප්‍රසංගවල නවතම ගායන, වාදන හා නර්තන නිර්මාණ
- වෘත්තීය නර්තන කණ්ඩායම් බිහි වීම

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....